රාත්රියේ නැගිට සලාත් ඉටු කොට තම බිරිය අවදි කරවා ඇය පිටුපාන විට ඇයගේ මුහුණට ජලය ඉසින මිනිසකුට අල්ලාහ් කරුණා කරත්වා! එමෙන්ම රාත්රියේ නැගිට සලාත් ඉටු කොට තම ස්වාමි පුරුෂයා අවදි කරවා ඔහු පිටුපාන විට ඔහුගේ මුහුණට ජලය ඉසින කාන්තාවකට අල්ලාහ් කරුණා කරත්වා!

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව අබූ හුරෙය්රා - රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “රාත්රියේ නැගිට සලාත් ඉටු කොට තම බිරිය අවදි කරවා ඇය පිටුපාන විට ඇයගේ මුහුණට ජලය ඉසින මිනිසකුට අල්ලාහ් කරුණා
කරත්වා! එමෙන්ම රාත්රියේ නැගිට සලාත් ඉටු කොට තම ස්වාමි පුරුෂයා අවදි කරවා ඔහු පිටුපාන විට ඔහුගේ මුහුණට ජලය ඉසින කාන්තාවකට අල්ලාහ් කරුණා කරත්වා!“
[හසන් ගණයට අයත් හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - ඉමාම් අබූ
දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

සැබැවින්ම කවරෙකු රාත්රියේ අවදි වී, සලාතය ඉටු කර, සලාතය සඳහා තම බිරිය ද අවදි කරවා ඇයද තද නින්දට වැටී මැලිකමින් අවදි නොවන විට, ඇයගේ මුහුණට ජලය සුළුවෙන් ඉසින්නේද එවිට සැබැවින්ම ඔහු අල්ලාහ්ගේ ආශිර්වාදය ලබන්නට සුදුස්සකු වන්නේය. එසේ බිරියක් තම සැමියා සමග කටයුතු කළ ද අල්ලාහ්ගේ ආශිර්වාදය ලබන්නට සුදුස්සියක් වන්නීය යැයි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා දන්වා සිටියේය.

http://www.sunnah.global/hadeeth/si/show/3717